**පුරවැසි සන්ධානය**
**குடிமக்கள் கூட்டணி**
**Citizens' Alliance**

**අලුත් රටක්.., වෙනස් මගක්.**

20024.07.19

## මාධ්‍ය නිවේදනය: 22 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ජනතා අවශ්‍යතාවක් නොවේ.

පුරවැසියාගේ ප්‍රජාතන්ත්‍රවාදී ඡන්ද අයිතිය සහ දේශපාලන ක්‍රියාවලිය ව්‍යාකූලත්වයට මග පාදමින් ජනාධිපතිවරයා විසින් නිකුත් කර ඇති 22වන ආන්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ පුරවැසි සන්ධානය ලෙස අපගේ දැඩි අප්‍රසාදය සහ විරෝධය ප්‍රකාශ කරන්නෙමු.

රටේ අධිකරණ ඇමතිවරයා විසින් මේ මොහොතේ කිසිසේත්ම ජනතාවගේ ඉල්ලීමක් නොවූ 22වන ආන්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැසට් පත්‍රයේ පලකිරීම අත්හිටුවන ලෙස අධිකරණ අමාත්‍යාංශ ලේකම්වරයාට උපදෙස් දී තිබියදී ජනාධිපතිවරයා විසින් අත්තනෝමතික ලෙස හදිසියේ එම ක්‍රියාවලියට මැදිහත් වීම අප තරයේ හෙලාදකින්නෙමු.

එම මැදිහත් වීම ජනතාවගේ ප්‍රමුඛ අවශ්‍යතා දහසකුත් පසෙකලා, තම ධුරයේ පැවැත්ම හා පටු දේශපාලන අවශ්‍යතා වෙනුවෙන් සිතාමතා රටේ ජනතාවගේ ඡන්ද අයිතිය, ආන්ඩුක්‍රම ව්‍යවස්ථාව හා ව්‍යවස්ථාදායකය හෑල්ලුවට ලක් කිරීමක් ලෙස අපි සලකන්නෙමු.

රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා හැම විටම ජනතා බලය හමුවේ ලබා ඇති අම්හිරි ඓතිහාසික පරජයන් හමුවේ මෙවර ද මෙසේ ව්‍යවස්ථාවේ සිදුරු සොයමින් ජනතා ඡන්දයෙන් සැඟව තවදුරටත් බලයේ එල්ලී සිටීමට දරණ මෙවැනි අවස්ථාවාදී පහත් උත්සාහයන් පරාජය කිරීමට පක්ෂ පාට බෙදීම් පසෙකලා සියලු පාර්ශ්ව එක්ව කටයුතු කලයුතු බවත් ඒ වෙනුවෙන් "පුරවැසි සන්ධානය" හැමවිටම කටයුතු කරන බවත් අවධාරණය කරන්නෙමු.

කැලුම් අමරසිංහ

ලේකම්, පුරවැසි සන්ධානය

Kelum Amarasinghe - Secretary +94 71 979 7244
Palitha Wickramarathne – National Organizer +94 77 556 9828
Sanka Abayawardena – Secretary International Relations - +94 71 611 9347